# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## ඉතිහාසය

විභාග අංකය:.........................................

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 3 |
|---|---|---|

පොදු උපදෙස් :

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III වන කොටසින් එක් ප්‍රශ්නයකටද පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශන සංඛ්‍යාව හයකි.

I කොටස

(01) අ. i. පහත දැක්වෙන ඓතිහාසික ස්ථාන සියල්ලම දී ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
කළු ගඟ, කන්තලේ වැව, බුන්දල, පඬුවස්නුවර, යාපන නගරය, කල්පිටිය, මඩකලපුව, පරාක්‍රම සමුද්‍රය, කනගරායන් ආරු, බදුල්ල, ගොඩවාය, හෝර්ටන් තැන්න

ii. පහත සඳහන් සියළුම ස්ථාන සපයා ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.
පෘතුගාලය, කල්කටා, මධ්‍යධරණී මුහුද, ජාවා දූපත, මලක්කා සමුද්‍ර සන්ධිය,චීනය

(ලකුණු 18)

ආ . පහත සඳහන් A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A ජය ගඟ හෙවත් යෝධ ඇළ ඉදිකළ රජතුමා
B පොළොන්නරුව චෝළ ආධිපත්‍යයෙන් මුදාගත් රජතුමා
C ප්‍රථම වරට දුරකතනය සොයාගත් තැනැත්තා.
D 1803 උඩරට ආක්‍රමණය මෙහෙයවූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

ඇ. A හා B යටතේ ඇති රූප අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

1. රූපයේ දැක්වෙන නිර්මාණය කුමක්ද?
2. මෙම නිර්මාණයෙන් සිදුවන කාර්යය කුමක්ද?
3. මෙය කවර වාරි නිර්මාණයක් ආශ්‍රිතව දැකිය හැකිද?
4. මේ අසල ඉදිවූ නූතන ජලාශය කුමක්ද?



A

1. රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. එය නිපදවූ තැනැත්තා කවුද?
3. මෙමගින් සිදුවන කාර්යය කුමක්ද?
4. මෙය කවර කර්මාන්තයක් හා සම්බන්ධ වේද?



B

(ලකුණු 12)

II කොටස

(02) i. පූර්ව ඓතිහාසික යුගයේ කැපී පෙනෙන ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 03)
ii. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණික දැනුම, උඩරංචාමඩම ආශ්‍රිත කැනීම් වලින් අනාවරණය කර ගත් තොරතුරු දෙකක් ලියන්න. (ලකුණු 04)
iii. පූර්ව ඓතිහාසික යුගයේදී මිය ගිය අය වෙනුවෙන් පැවති අවමංගල්‍ය චාරිත්‍ර දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iv. ඓතිහාසික යුගයේ පැවති ආර්ථික රටාව තුළ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය නිදසුන් තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) i. වැවක ප්‍රධාන තාක්ෂණික අංග තුනක් නම් කරන්න. (ලකුණු 03)
ii. ඓතිහාසික යුගයේදී මහ වැව් තැනීමට හේතුවූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)
iii. අතීතයේදී ගෘහ නිර්මාණය සඳහා යොදාගත් තාක්ෂණය පිළිබඳ උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iv. A. අතීතයේ ශ්‍රී ලංකාවේ දියුණු යකඩ නිස්සාරණ තාක්ෂණයක් තිබුණු බවට පුරාවිද්‍යාත්මක තොරතුරු ලැබෙන ස්ථාන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
B. එම ස්ථානයන්හි යකඩ නිස්සාරණය කළ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04)

(04) i. දෙවන නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන තුනක් පිළිවෙලින් දක්වන්න. (ලකුණු 03)
ii. දෙවන නාගරීකරණ අවධියේ බිහිවූ පිරිවෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)
iii. දෙවන නාගරීකරණ සමයේ ආර්ථික රටාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iv. ගම්පොළ රාජධානි සමයේ මෙරටට එල්ලවූ දේශීය හා විදේශීය බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) i. ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට පෙර මෙරටට වරින් වර පැමිණි ඉංග්‍රීසි දූතයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)
ii. බ්‍රිතාන්‍යයින් ත්‍රිකුණාමලය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)
iii. 1815 දී බ්‍රිතාන්‍යයින් හට උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට හැකිවූයේ කෙසේද? කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iv. 1848. දෙවන නිදහස් සටනට බලපෑ හේතු තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(06) i. කෝල්බෲක් ප්‍රතිසංස්කරණය අනුව ශ්‍රී ලංකාව බෙදූ පළාත් තුනක් ලියන්න. (ලකුණු 03)
ii. කෙටි පිළිතුරු ලියන්න.
A ආණ්ඩුකාරවරුයාගේ බලය අඩු කිරීමේ අටියෙන් කෝල්බෲක් ඉදිරිපත් කළ යෝජනාව
B ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා විධිමත් පෙත්සමක් යටත්විජිත භාර ලේකම් වරයාට ඉදිරිපත් කළ තැනැත්තා
C 1919 පිහිටවූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා
D මෙරටට අග්‍රාණ්ඩුකාරධූරය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (ලකුණු 04)
iii. 1912 අමද්‍යප උද්ඝෝෂණ ව්‍යාපාර වල කැපී පෙනුන ලක්ෂණ දෙකක් දක්වා එම උද්ඝෝෂණ වල ප්‍රතිඵල දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iv. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කරීම තුළින් අත්වූ වාසි දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) i. ශ්‍රී ලංකාවේ වතු වගාව බහුලව ව්‍යාප්තවූ දිස්ත්‍රික්ක තුනක් ලියන්න. (ලකුණු 03)
ii. වතු වගාවේ දියුණුවට මුල්වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් ලියන්න. (ලකුණු 04)
iii. වතු කෘෂිකර්මාන්තයෙන් උදාවූ යහපත් ප්‍රතිඵල තුනක් විස්තර කරන්න. (ලකුණු 05)
iv. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට ඇතිවූ සමාජ ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III කොටස

(08) i. යුරෝපා ඉතිහාසයේ ප්‍රධාන යුග තුන නම් කරන්න. (ලකුණු 03)

ii. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

iii. යුරෝපා පුනරුදය තුළින් භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනයක් සිදුවූ බව කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. පුනරුදය සමඟ යුරෝපයේ ඇතිවූ ආර්ථික හා දේශපාලන වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) i. කාර්මික විප්ලව සමයේ පහත සඳහන් නිර්මාණ බිහිකල පුද්ගලයින් නම් කරන්න.

A ආරක්ෂක ලාම්පුව

B දුවන නඩාව

C දුම්රිය එන්ජිම (ලකුණු 03)

ii. A බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු ආකර පැවති ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 02)

B ගල් අඟුරු වලින් ලබා ගන්නා ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

iii. යුරෝපයේ අනෙක් රටවල් හා සසඳන විට බ්‍රිතාන්‍යය තුළ කාර්මික විප්ලවය උදාවීමට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. කාර්මික විප්ලවය හේතු කොටගෙන දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)